**22-04-2024** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, බාබා පමණයි සියලුම දෙනාගේ ගැලවුම්කරුවා වන්නේ. බාබා මෙන් පරාර්ථ සේවය කිරීමට වෙන කිසිම කෙනෙකුට බැහැ.

**ප්‍රශ්නය:** නව ලෝකය තැනීම සඳහා බාබා විසින් දැරිය යුතු උත්සාහය කුමක්ද?

**පිළිතුර:** බාබා විසින් දැරිය යුතු එකම උත්සාහය තමයි අජාමිල් මෙන් අපිරිසිඳුතාවයට ලක් වී සිටින අයව ලක්ෂ්මී හා නාරායන මෙන් වැඳුම් ලැබිය හැකි අය බවට පත් කිරීම. දරුවන් දිව්‍ය තත්ත්වයට ගෙන ඒමටයි බාබා මේ උත්සාහ දරන්නේ. අන් සියලුම ජීවාත්මයන් සාම දේශය කරා යනවා. ඔබ සියලුම දෙනා ශක්තිමත් විය යුතුයි. ඔබ ඔබගේ කර්ම සියල්ලම ගෙවා පසුව නිවස බලා යනවා.

**ගීතය:** මේ පාපකාරි ලොවින් එතෙරට නිදහස් සුවපහසු තැනකට අපව රැගෙන යන්න...

ඕම් ශාන්ති. සුමිහිරි ආධ්‍යාත්මික දරුවනි, ඔබ එම ගීතය ඇසුවා. දරුවනි, ඔබ දන්නවා මෙය පාපකාරී ලෝකයක් බව. නව ලෝකය තමයි පාපයෙන් තොර පිනෙන් යුතු වූ ලෝකය. එය රාමාගේ රාජ්‍යය ද මෙය රාවන්ගේ රාජ්‍යය ද වේ. මෙම රාවන්ගේ රාජ්‍යයේ සිටින සියලුම දෙනා අපිරිසිඳු අසතුටින් සිටින අයයි. එමනිසා, තමයි ඔවුන් කතා කරන්නේ: අහෝ පාරිශුද්ධකරුවාණනි, පැමිණ අපව පිරිසිඳු කරන්න! සෑම ආගමකම මිනිසුන් මෙසේ කෑ ගසනවා: අහෝ දෙවියනි, පියාණනි පැමිණ අපව ගලවා ගන්න. අපේ මඟපෙන්වන්නා බවට පත්වන්න! බාබා පැමිණුනු පසු ඔහු සියලුම ආගම් වල මිනිසුන් නිවස කරා ගෙන යනවා. මේ මොහොතේ සැවොම ඉන්නේ රාවන්ගේ රාජ්‍යයෙහියි. බාබා සියලුම ආගම් වල අය සාම දේශය වෙත ගෙන යනවා. සෑම කෙනෙකුම විනාශ වී යනවා. බාබා මෙහි පැමිණ ඔය දරුවන්ව සතුටු දේශයට සුදුසු අය බවට පත් කරවනවා. ඔහු සෑම කෙනෙකුටම ප්‍රයෝජනයක් ගෙන එනවා. එමනිසා, තමයි ඒකායන තැනැත්තා හඳුන්වන්නේ, සියලු දෙනාටම ගැලවීම ලබාදෙන්නා, යහපත සළසන්නා ලෙස. පරමාත්ම පියා කියනවා: ඔබ දැන් ඔබගේ නිවස කරා යා යුතුයි. සියලු ආගම්වල මිනිසුන් දැන් සාම දේශය, නිර්වාණ දේශය වෙත යා යුතුයි. එය තමයි සියලු ජීවාත්මයන් නිහඬතාවයේ සිටින ස්ථානය. ඒ අසීමිත පියා නිර්මාණකරුවා පැමිණ සියලුම දෙනාට මුක්තියත් ජීවන මුක්තියත් ලබා දෙනවා. එමනිසා, ඒ එකම පරමාත්ම දෙවියන්, පරමාත්ම පියා පමණයි ප්‍රශංසාවට ලක් විය යුත්තේ. ඔහු පමණයි මතක් විය යුත්තේ. බාබා ඔහු විසින්ම විස්තර කරනවා: මම තමයි ඒ දුරම ස්ථානයේ පදිංචිකරුවා. ආදී සනාතන දෙව් දේවතා ධර්මය තවත් ඇත්තේ නැහැ. එමනිසා තමයි සියලුම දෙනා මට කෑ ගසන්නේ, පැමිණ අප බේරාගන්න කියා. මම මෙහි පැමිණ සියලුම දරුවන් නිවසට ගෙන යනවා. හින්දු ධර්මය කියා වෙනම ධර්මයක් නැහැ. මුලින්ම එය දේවතා ධර්මයයි. නමුත් ඔවුන් පිරිසිඳු නැති නිසා ඔවුන් තවත් දෙව් දේවතාවුන් කියා හැඳින්විය නොහැකියි. ඒ වෙනුවට ඔවුන් විසින්ම කියා ගන්නවා අපි හින්දූන් කියලා. කිසිම කෙනෙක් හින්දූ ධර්මය නිර්මාණය කරන්නේ නැහැ. ගීතාව තමයි සෑම ධර්මයකම මැණික වන්නේ. මෙම ගීතාව කියන්නේ බාබා විසින්. ඒකායනය පමණයි අපට දෙවියන් ලෙස හැඳින්විය හැක්කේ. ඔහු තමයි අපේ පියා. ක්‍රිෂ්ණා හෝ ලක්ෂ්මී සහ නාරායන හෝ, සත්‍යය, පියා, පාරිශුද්ධකරුවා ලෙස හැඳින්විය නොහැකිය. ඔවුන් රජ හා රැජිණයි. ඔවුන් එම තත්ත්වයට පත්කළේ කවුද? බාබායි. බාබා පළමුවෙන්ම එම ලොව තනනවා, මොහු එහි පාලකයා බවට පත්වෙනවා. ඔවුන් වෙනුවෙන් දේවාල සාදන ලද ඒ ලක්ෂපතියන්ගෙන් අහන්න කොහොමද ඔවුන් ලෝක පාලකයන් බවට පත්වූයේ? කොහොමද ඔවුන් මේ රාජ්‍යය ලබා ගත්තේ? කියලා. ඒ කිසිම කෙනෙකුට පිළිතුරක් දීමට හැකි වන්නේ නැහැ. ඔවුන් එවැනි ඵලයක් ලබා ගැනීම සඳහා මොනවගේ ක්‍රියා ද කර ඇත්තේ? බාබා දැන් කියා දෙනවා ඔබ ඔබගේම ආගම අමතක කර දමලා. මිනිසුන් ඔවුන්ගේ ආදී සනාතන දෙව් දේවතා ධර්මය අමතක කර ඇති නිසා ඔවුන් වෙනත් ආගම් කරා ඇදී යනවා. දැන් ඔවුන් පැමිණ ඇත්තේ ඔවුන්ගේ නියම ආගම දැන ගන්නයි. ආදී සනාතන දෙව් දේවතා ධර්මයට අදාල අය නැවතත් ඔවුන්ගේ ආගමට යනවා. ක්‍රිස්තියානි ආගමට අයත් අය නැවත ක්‍රිස්තියානි ආගමට යනවා. මෙහිදී පැළ කරන පැළය අදාල වන්නේ ආදී සනාතන දෙව් දේවතා ධර්මයටයි. ජීවයන් කුමන ආගමකට ගියත් ඔවුන් ඔවුන්ගේම ආගමට යා යුතුයි. මෙය ඇත්තෙන්ම වෘක්ෂයක්. මෙහි වැඩීම ඇති වන්නේ ඔවුන්ගෙන්. ඔබට වෙන කිසිම කෙනෙකුට මෙම දැනුම දිය නොහැකියි. බාබා කියනවා ඔබ දැන් ඔබගේම ආගමට යා යුතුයි. සමහරු

කියනවා ඔවුන් සන්යාසීන්ගේ ආගමට අයත්ය කියලා. සමහරු කියනවා ඔවුන් රාමක්‍රිෂ්ණා පරමහාන්ස්ගේ අනුගාමිකයින් කියලා (එක් ගුරු කෙනෙක්). සන්යාසීන් අයත් වන්නේ සියලු දේ අත්හැරි කණ්ඩායමට නමුත් ඔබ අයත් වන්නේ ගෘහ ජීවිතයටමයි. ගෘහ ජීවිතයට අයත් අය කොහොමද සියලු දේ අත්හැරි කෙනෙකුගේ අනුගාමිකයෙක් වෙන්නේ? පටන් ගන්නා කාලයේදී නම් ඔබගේ ගෘහ ජීවිතයත් පිරිසිදුයි. පසුව රාවන් මගින් ඔබව අපිරිසිඳු කළා. බාබා මේ සියලුම දේ ඔබට කියා දෙනවා. ඔබ අයත් වන්නේ පිරිසිඳු ගෘහ ජීවිතය නැමැති ආගමටයි. පසුව ඔබ අන් අයව වන්දනා කරන වන්දනාකරුවන් බවට පත් වෙනවා. බාබා දැන් ඔබ විසින් කරන ලද භක්තියෙහි ප්‍රතිඵලයක් ලෙස ඔබට ගැලවීම ලබා දීමට පැමිණ සිටිනවා. ආගම ඇත්තෙන්ම ශක්තියක් බව කවුරුත් දන්නවා. බාබා තමයි ආගම තනන්නේ. ඔබ මුළු ලෝකයේම පාලකයන් බවට පත් වෙනවා. ඔබ බාබාගෙන් විශාල ශක්තියක් ලබනවා. ඒ එකම ගැලවුම්කරුවා, සර්ව බලධාරියා, බාබා පමණයි ඔබට ගැලවීම ලබා දෙන්නේ. වෙන කිසිම කෙනෙකුට මෙය කරන්න බැහැ. වෙන කිසිම තැනකින් මෙය සොයා ගන්න බැහැ. මෙහි ජනගහනය ක්‍රමයෙන් වැඩිවෙනවා තවමත් කිසිම කෙනෙකුට නිවස බලා යා නොහැකියි. බාබා කියනවා මම තමයි සෑම ආගමකම සේවකයා. මම මෙහි පැමිණ සෑම දෙනාම ගලවා ගන්නවා. ගැලවීම යනු සත් යුගයයි. මුක්තිය ලැබෙන්නේ සාම දේශයේදී ඉතින් කවුද හැමගෙන්ම උසස්? බාබා කියනවා ඕ දරුවනි, ඔබ සියලු දෙනාම සහෝදරවරුන්ය. සෑම ජීවයක්ම එහි උරුමය බාබාගෙන් ලබා ගන්නවා. මම ඇවිත් ඔවුන්ව අදාල ස්ථාන කරා ගෙන යාමට ඔවුන්ව ශක්තිමත් කරනවා. ඔවුන් ශක්තිමත් වූයේ නැති නම් ඔවුන් දඬුවම් ලැබිය යුතුයි. ඔවුන් කර්ම ගෙව්වායින් පසු නිවස බලා යනවා. එය තමයි සාමයේ දේශය. අනෙක් එක තමයි සතුටේ දේශය. බාබා කියනවා මම මෙහි පැමිණ නව ලොව තනනවා. මේ සඳහා උත්සාහය අවශ්‍යයි. අජාමිල්ගේ තත්ත්වයට පත් වී පවෙහි ගැලෙන අය මම ලක්ෂ්මි නාරායන් තත්ත්වයට පත් කළ යුතුයි. ඔබ පවෙහි ගැළුණු දා සිට මෙම ඉනිමගෙහි පහළට බැසගෙන එනවා. ඔබ උපත් 84ක් තිස්සේ පහළට බැසගෙන එනවා. ඔබ සතෝප්‍රධාන් තත්ත්වයෙන් සතෝ තත්ත්වයට පත් වී පසුව රජෝ තත්ත්වයටත් තමෝ තත්ත්වයටත් පත් වූවා. බාබා කියනවා මම එන්නේ එකම සැරයයි. ඒ තමයි මේ සංගම් යුගය. මම ප්‍රජාපිතා බ්‍රහ්මාතුමාගේවත් බුදුන්වහන්සේගේ ශරීරයටවත් ඇතුළු වන්නේ නැහැ. මම එන්නේ ඉතාමත් වැදගත් වූ සංගම් යුගයේදී පමණයි. ඔබට දැන් කියා ඇත්තේ පියා අනුගමනය කරන්නයි. බාබා කියනවා ඔබ සියලු දෙනා මගේ දිශාවන් පිළිපැදිය යුතුයි. ඔබ මා පමණක් සිහි කළ යුතුයි. මෙම යෝගා බලයෙන් පමණයි ඔබගේ පව් විනාශ කළ හැක්කේ. මෙය හඳුන්වන්නේ යෝගා ගින්නක් වශයෙන්. ඔබ තමයි නියම බ්‍රහ්මිණ් දරුවන්. ඔබ රාගය නැමැති ගින්නෙන් මිදී දැන් දැනුම නමැති ගින්නෙහි සිටිනවා. මේ එකම බාබා හට පමණයි මෙය තේරුම් කළ හැක්කේ. ජේසු තුමාත් බුදුන්වහන්සේත් මොහුව මෙනෙහි කරනවා. නමුත් ඔවුන් නියම වශයෙන් මේ කවුද යන්න දන්නේ නැහැ. ඔබ සියලු දෙනා දැන් දේවවාදීන් බවට පත්වී තිබෙනවා. බාබා දැන් මෙහි නිර්මාණකරුවාත් එම නිර්මාණය ගැනත් සම්පූර්ණ හැඳින්වීම ඔබට ලබා දී තිබෙනවා. සන්යාසීන් හා පූජකවරුන් සාමාන්‍යයෙන් කියනවා නේති, නේති (මෙය නැත්නම්, මෙය) කියලා. කිසිම දුකක් නොමැති සත්‍යයේ දේශය වන්නේ සත් යුගයයි. මෙහිදී නම්, දුකෙන් පිරුණු ආයුෂ කාලය ඉතාම කෙටි කාලයක්. දේවී දේවතාවන්ගේ නම් ආයු කාලය ඉතාමත් දීර්ඝයි. ඔවුන් පිරිසිඳු යෝගීන්. නමුත් මෙහි ඉන්නේ භෝගීන් (ඉන්ද්‍රිය වින්දනයෙහි ගැලෙන අපිරිසිඳු මිනිසුන්). මෙම ඉනිමගෙහි බැසගෙන එන තරමටම උපත් වලත් ආයු කාලය කෙමෙන් පිරිහී යනවා. අකල් මරණ පවා සිදුවෙනවා. බාබා ඔබව කෙතරම් විශාල පරිවර්ථනයකට ලක් කරනවාද කියතොත් උපත් 21ක් යන තුරුම ඔබ කිසිම අසනීපයකින් පෙලෙන්නේ නැහැ. එමනිසා, එවැනි පියෙකුගෙන් ඔබ අනිවාර්යෙන්ම උරුමය ලබා ගත යුතුයි. ඔබගේ බුද්ධිය දැන් සිහි එළවා ගත යුතුයි. බාබා ඔබට කිසිම ආකාරයක අසතුටක් අත් නොවන අකාරයට ඔබගේ උරුමය ලබා දෙනවා. ඔබගේ සියලුම දුක් කඳුළු දැන් හමාරයි. ඔබ සියලුම දෙනා නළුවන්. ඔබ ඔබගේ ශරිරය අත්හැර අනෙක් ශරිරය වෙත යනවා. මෙයත් නාටකයේ තිබෙන දෙයක්. බාබා හොඳ කර්මාවලත් නරක කර්මාවලත් සාමාන්‍ය කර්මාවලත් තේරුම හොඳින් කියා දෙනවා. ක්‍රිෂ්ණා ජීවය ඔහුගේ උපත් 84 පසුකර දැන් අවසානයේ දී එම දැනුමම යලිත් ලබනවා. 'බ්‍රහ්මාගේ දවසත් රැයත්' යන වැකිය මෙහිදී සිහියට එනවා. 'බ්‍රහ්මාගේ දවසත් රැයත්' බ්‍රහ්මින් දරුවන් වන ඔබගේත් දවසත් රැයත් වෙනවා. ඔබගේ දවස දැන් පැයීමට ආසන්නයි. ඔවුන් මහා ශිව රාත්‍රිය ගැන කතා කරනවා. වන්දනාවේ දීර්ඝ රැයක් පසු කරමින් දැන් දැනුම නමැති දවස ආරම්භ වීමටයි යන්නේ. දැන් ඒ දෙකෙහිම සංගමය පවතින අවස්ථාවේ ඔබ යලිත් සත් යුගයේ පදිංචිකරුවන් වීමට යනවා. ඔබ භක්තියට යටවෙමින් දීර්ඝ රැයක් තිස්සේම අතපතගාමින් සිටියා. ඔබ ඔබගේ නළල මධ්‍යය සරසාගෙන ඔබගේ සියලුම මුදල් අවසන් කර දැමුවා. බාබා කියනවා මම දැන් පැමිණ පළමුව ඔබ සාමයේ දේශයටත් පසුව සතුටේ දේශයටත් ගෙන යනවා. ඔබ එම සතුටු දේශයේ සිටියා. උපත් 84ක් ගන්නා අතරතුර

ඔබ දුක් දේශයට පැමිණුනා. ඉන් පසු ඔබ අඬ ගසනවා බාබා, මේ පරණ ලෝකයට එන්න. මෙය ඔබගේ ලෝකය නොවේ. ඔබ දැන් යෝගා බලයෙන් ඔබගේ ලෝකය නිර්මාණය කරනවා. ඔබ සැම දැන් සියලු පවින් මිදිය යුතුයි. ඔබ දැන් රාගයේ අසිපත ගැනීමත් අන් අය සමඟ රණ්ඩු කිරීමට යාමත් නවතා දැමිය යුතුයි. බාබා කියනවා මම සැම අවුරුදු 5000කටම වරක් මෙහි එනවා. මෙම චක්‍රය අවුරුදු 5000ක චක්‍රයක් මිස අවුරුදු සිය දහස් ගණනක චක්‍රයක් නොවේ. එය අවුරුදු සිය දහස් ගණනක එකක් වූවා නම් මෙහි ජනගහනය දිගින් දිගටම වැඩි වීමට ඉඩ තිබුණා. ඔවුන් දිගින් දිගටම බොරු කතා ගොතමින් සිටිනවා. මේ නිසා තමයි බාබා කියන්නේ මම සැම චක්‍රයක් චක්‍රයක් පාසාම මෙහි එනවා. මමත් මට අයිති කොටස රඟ පෑ යුතුයි. මගේ කොටසේ නැති දෙයක් කිසිම විටෙක මට රඟපෑ නොහැකියි. මමත් මෙම නාටකයේ බැඳිලා ඉන්නේ. මම මගේ නිවැරදි වෙලාවට එනවා. මන්මනාභව්! කොහොමනමුත්, කිසිම කෙනෙක් මෙහි තේරුම දන්නේ නැහැ. බාබා කියනවා සියලුම ශරීර සම්බන්ධකම් කඩා දමා මා සමඟ පමණක් සිහිය පවත්වා ගත හොත් ඔබට පිරිසිදු විය හැකියි. දරුවනි, ඔබ පිරිසිදු තත්ත්වයට පත්වීමට නිරන්තරයෙන් උත්සාහ දැරිය යුතුයි. මෙය තමයි ලෝක ආධ්‍යාත්මික විශ්ව විද්‍යාලය. සත්‍ය පියා දැන් මුළු ලෝකයම පරිවර්ථනයකට ලක් කිරීම සඳහා පැමිණ සිටිනවා. ඔබ විසින් පාලනය කළ සත් යුගය දැන් අපායෙන් පරිවර්ථනයකට ලක් කළ යුතුයි. බාබා කියනවා දැන් ඉතින් මා සිහිකරන්න. එවිට ඔබ තමෝප්‍රධාන් තත්ත්වයෙන් සතෝප්‍රධාන් තත්ත්වයට පත්වෙයි. මෙම ශරීරය තමයි බාබා ඇතුල්වන වාසනාවන්ත ශරීරය. කිසිම කෙනෙක් ශිවාගේ උපන් දිනය ගැන දන්නේ නැහැ. ඔවුන් කියනවා ඔහු නමක් නැති, ස්වරූපයක් නැති කෙනෙක් කියලා. අහෝ! නමක් නැති, ස්වරූපයක් නැති කිසිම දෙයක් තිබිය නොහැකියි. ඔවුන් අහස ගැන කතා කරනවා. එය හිස් තැනක් වුවත් එම ස්ථානයටත් නමක් තිබෙනවා. ඉතින් බාබාටත් නමක් තිබෙනවා ඔහු තමයි ප්‍රයෝජනයක් ගෙන එන්නා. භක්ති මාර්ගයේ නම්, ඔහුට බොහෝ සෙයින් නම් ලබා දෙනවා. ඔවුන් බබුල්නාථ ලෙසත් ඔහු හඳුන්වනවා (කටු වලට අධිපති). ඔහු පැමිණ මිනිසුන් රාගයෙන් මුදවා පාරිශුද්ධ කරවනවා. හුදෙකලා මාර්ගයේ මිනිසුන් ආලෝක දනච්චත් දෙවියන් කියා හිතනවා. ඔවුන් එය පමණයි මතක් කරන්නේ. ඔවුන් හඳුන්වන්නේ එම ආලෝක දනච්ච සමඟ යෝගා කරන අය ලෙසයි. කොහොමනමුත්, මෙම ස්ථානයමයි බ්‍රහ්මාණ්ඩ ලෙස හඳුන්වන්නේ. ඉන් පසු ඔවුන් එම ආලෝක දනච්ච දෙවියන් කියා හිතනවා. ඔවුන් විශ්වාස කරනවා ඔවුන්ට මෙය ඇතුළට යා හැකියි කියලා. එයින් ඔවුන්, ජීවයන් විනාශ වෙන සුළුයි කියා අදහස් කර තිබෙනවා. බාබා කියනවා මට පමණයි ඔබ සියලුම දෙනාට ගැලවීම ලබාදිය හැක්කේ. මේ නිසා තමයි ශිව බාබාගේ උපත පමණක් දියමන්තියක් සේ වටින්නේත් අනෙක් සියලුම උපත් බෙලි කටුවක් තරම්වත් නොවටින්නේත්. ශිව බාබා පමණයි සැමටම ගැලවීම ලබා දෙන්නේ, එමනිසා තමයි ඔහු දියමන්තියක් සේ වටිනා කෙනෙක් වන්නේ. ඔහු පමණයි ඔබ සත් යුගයට ගෙන යන්නේ. බාබා හට පමණයි ඔබට මෙම දැනුම දිය හැක්කේ. මෙම දැනුම ගැනීමෙන් ඔබ දේවී දේවතාවන් බවට පත් වෙනවා. මෙම දැනුම පසුව නැති වී යනවා. ලක්ෂ්මී සහ නාරායන්ට නිර්මාණකරු හෝ නිර්මාණය ගැන දැනුම නැත. ඔය දරුවන්ට ගීතය ඇසුනා. ඉන් කියන්නේ මේ පාපකාරී ලොවින් එතෙරට නිහඬ නිදහස් තැනකට අපව රැගෙන යන්න. ඒ තමයි සාමයේ දේශය, පසුව සතුටේ දේශය තිබෙනවා. අකල් මරණ කිසි විටෙක එහි ඇති වන්නේ නැහැ. බාබා දැන් පැමිණ තිබෙන්නේ දරුවන් ඒ සැප පහසු සතුටේ දේශය කරා රැගෙන යාමටයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**රාත්‍රී පංතිය**

දැන්, ඔබේ සූර්ය වංශය හා චන්ද්‍ර වංශය යන දෙකම නැවත නිර්මාණය වෙමින් තිබෙනවා. ඔබ කොතරම් දුරට පාරිශුද්ධ වනවා ද කියා කිසිවෙකුටත් දැනගත නොහැකියි. පියා පැමිණ ඇති වග ඔවුන්ට ඇසුණු විට ඔවුන් ඔහුව සිහි කරන්නට පටන් ගනීවි. ඔබ තවදුරටත් වර්ධනය වන විට ඔබ මේ සියල්ල දකීවි. සිය දහස් ගණනින් සහ මිලියන ගණනින් දිගටම මෙය වටහා ගනීවි. වාතාවරණය එසේ වේවි. අවසානයේදි සිදුවන යුද්ධයෙන් සියලු දෙනාම බලාපොරොත්තු සුන් කර ගනීවි. හැම කෙනාටම ස්පර්ෂ වේවි. ඔබේ හඬ පැතිරේවි. දෙව්ලොව ස්ථාපනය වෙමිනුයි තිබෙන්නේ. එනමුත් ඒ හැම කෙනාගේම මරණය ද සූදානම්ව තිබේ. කොහොමනමුත්, ඒ කාලය අඩුම තරමේ හුස්ම ගන්නවත් නොහැකි තරම් එවන් කාලයක් වේවි. ඔබ තව දුරටත් වර්ධනය වන විට බොහෝ අය හොඳින් තේරුම් ගනීවි. ඒකෙන් කියැවෙන්නේ නැහැ ඔබ සියල්ලන්ම (දැනට සිටින අය) එම

කාලයේ මෙහි ඉන්නවා කියා. සමහර අය මියැදීත් සිටීවි. පෙර චක්‍රයේ මෙහි සිටිය අය පමණක් (මේ කාලයේ දී) මෙහි හිඳීවි. එම කාලයේ දී ඔබ සැවොම එකම පියාගේ ස්මෘතියේ හිඳීවි. ශබ්දයත් අඩු වේවි. ඔබ එවිට නොකඩවා ඔබව ජීවාත්ම සත්තාවන් ලෙස සලකා පියා සිහි කරාවි. මේ සියල්ලම ඔබ නොබැඳි නිරීක්ෂකයන් ලෙසින් නිරීක්ෂණය කරාවි. එහිදී නොකඩවා බොහෝ වේදනාකාරී විපත් දිගටම සිදු වේවි. විනාශය දැන් පටන්ගෙන ඇති බවත්, එයින් ලෝකය වෙනස්වන්නට යන බවත් සියල්ලන්ම දැන ගනීවි. බුද්ධිය පවසන්නේ බෝම්බ හෙලන විට විනාශය සිදු වේවි. යන්නයි. ඔවුන් දැන් එකිනෙකාට දිගින් දිගටම කියා ගන්නේ ඔබ බෝම්බ නොහෙලන බවට පොරොන්දු වන්න කියාය. කොහොමනමුත්, ඒ සෑම දේම සොයාගෙන ඇත්තේ විනාශය සඳහායි. ඔය දරුවන් බොහෝ සතුටින් සිටිය යුතුයි ඔබ දන්නවා නව ලොව නිර්මාණය වෙමින් තිබෙනා බව. පියා පමණක් නව ලොව ස්ථාපනය කරන බව ඔබට වැටහේ. එහිදී දුක පිළිබඳ සඳහනක්වත් නැත. එයට කියන්නේ පාරාදීසය කියාය. ඔබට ශ්‍රද්ධාව ඇති සේම එලෙසින් තවදුරටත් ඔබ වර්ධනය වන විට, අන් බොහෝ අයත් ශ්‍රද්ධාවන්ත වේවි. අවසානයේ දී ඔබ උසස් මට්ටමකින් ස්මෘති වන්දනාවේ හිඳීවි. මෙහිදී දැනුදු බොහෝ කාලය ඉතිරිව තිබෙනවා. ඔබ සම්පූර්ණ උත්සාහය නොදැරුවහොත් ඔබගේ තත්ත්වය බාල වේවි. ඔබ හොඳ තත්ත්වයක් ලබන්නේ උත්සාහ ගැනීමෙනුයි. එම කාලය වන විට ඔබේ ස්ථිතිය ඉතා හොඳ වේවි. ඔබට දර්ශන පවා ලැබේවි. සෑම චක්‍රයේම තිබෙන ආකාරයට විනාශය නැවතත් සිද්ධ වේවි. චක්‍රය පිළිබඳ විශ්වාසය ඇති සහ ඥානය ඇති අය සතුටින් සිටීවි. අච්චා. ආධ්‍යාත්මික දරුවන්ට සුබ රාත්‍රියක්.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිම ආකාරයක පවක් නොකර ඔබගේ යෝග බලයෙන් මෙම අපාය දිව්‍යලෝකයක් බවට වෙනස් කරන්න. තමෝප්‍රධාන් තත්ත්වයෙන් සතෝප්‍රධාන් තත්ත්වයට පත්වීමට උත්සාහ ගන්න.
2. එකම පියා පමණක් නියම ආකාරයෙන් සිහි කරන්න. නියම බ්‍රහ්මින් දරුවෙක් වී ඔබගේ සියලු පව් යෝගා නැමැති ගින්නෙන් පුළුස්සා දමන්න. අන් සියලු දෙනාමත් රාගය නැමැති ගින්නෙන් ඉවත් කර දැනුම නැමැති ගින්නෙහි අසුන්ගන්වන්න.

**වරදානය:** පරාර්ථකාමී අවදියක සිටිමින් සියලුම පාපකාරී සිතිවිලි වලින් මිදී සේවය කර ඔබ සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වේවා.

ඔබ කරන සේවයෙන් සාර්ථකත්වය ලැබීමේ පදනම වන්නේ පරාර්ථකාමී වීමත් සියලු පාපකාරී සිතිවිලි වලින් මිදී සිටීමත්ය. මෙම අවදියේ සිටීන්නන් සේවය කරන අතර තෘප්තිමත්ව හා සතුටින් සිටින අතර අන් අය ද ඔවුන් සම්බන්ධයෙන් තෘප්තිමත්ව සිටී. සේවා සමූහයක් තුළ විවිධාකාර සිදුවීම් සිදු වන අතර විවිධාකාර මත අදහස් ඇති වේ. නමුත් එම විවිධත්වය නිසා ඔබ පටලැවිල්ලට පත් නොවිය යුතුයි. මම කවුරු කියන දේ අහන්න ද, කවුරු කියන දේ නොඅහන්න ද කියා සිතන්න එපා. පරාර්ථකාමී අවදියක හා අන් සිතිවිලි වලින් මිදී තීරණ ගත් විට කිසිදු අයෙක් කිසිදු නිශ්ඵල සිතිවිල්ලක් නොසිතනු ඇත. එවිට ඔබ සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වේ.

**පාඨය:** දැන් සකාශ් දෙමින් බුද්ධින් පරිවර්ථනය කිරීමේ සේවය කරන්න.

***** ඕම් ශාන්ති *****